ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
இலங்கை தகவல் தொலைத்தொடர்பாடல் தொழில்நுட்ப நிறுவனம்
Information & Communication Technology Agency of Sri Lanka
*An Agency under the Presidential Secretariat*

ICTA
*ideas actioned*

මගේ අංකය: Re-Gov/Sin_Unicode

2008-11-24

රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

රාජ්‍ය අංශයේ සිංහල යුනිකේත භාවිතය

ශ්‍රී ලංකාවේ පරිගණක භාවිතයට මුල පිරුණ කාලයේ සිටම පරිගණක මගින් සිංහල බසින් කටයුතු කිරීමේ වැදගත්කම කැපී පෙනුනි.

1980 හා 1990 දශකවල සිංහල බස පරිගණකවල භාවිතය සඳහා නොයෙකුත් පුද්ගලයින් හා සමාගම් විසින් නොයෙකුත් උපක්‍රම හඳුන්වා දෙන ලදී. මෙම උපක්‍රම සිංහල බසින් පරිගණක තුල භාවිතය සඳහා ක්‍රමවේද සැපයුව ද එමගින් ප්‍රධාන ගැටළු 2ක් මතු කරන ලදී.

1. එක් එක් ක්‍රමවේද වෙනස් වූ කේතගත ක්‍රම භාවිතා කළ හෙයින් එක් ක්‍රමවේදයකින් නිපයූ පරිගණක ගොනුවක් එම ක්‍රමවේදය සඳහා අවශ්‍ය මෘදුකාංග හා ෆොන්ට් නොමැතිව විවෘත කිරීමට හා කියවීමට නොහැකි වීම.

2. එම ක්‍රමවේද සඳහා යොදා ගැනුනු මෘදුකාංග මිල අධික වීම.

මෙම ගැටළු විසඳීම සඳහා ගෝලීය ව භාවිතා කරන ප්‍රධාන උපක්‍රමය නම් යුනිකේත නමින් හැඳින්වෙන සියලුම භාෂාවන් සඳහා යොදා ගත හැකි අන්තර්ජාතික කේත ක්‍රමය භාවිතයයි. යුනිකේත ක්‍රමය මගින් ලෝකයේ භාවිත වන භාෂා 300කට අධික සංඛ්‍යාවක් මේ දක්වා එම ක්‍රමවේදය මගින් කේතගත කොට ඇත. මෙම ක්‍රමවේදය 1991 දී ලෝකයට හඳුන්වා දෙන ලද අතර 2001 වසරේ සිට සිංහල බසද යුනිකේත ක්‍රමයට කේතගත කරන ලදී. එසේම "විජේසේකර" යතුරු පුවරුව මෙම ප්‍රමිතිය සඳහා අදල ඉලෙක්ට්‍රොනික යතුරු පුවරුව ලෙස හඳුන්වා දෙන ලදී.

2001 වසරේදී සිංහල යුනිකේත මාලාව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් SLS 1134 මගින් පරිගණක මගින් සිංහල භාවිතය සඳහා ප්‍රමිතියක් ලෙස අනුමත කරන ලදී. මේ අනුව දැනට පවතින සියලුම මාදිලියේ ක්‍රියාත්මක පද්ධති (operating systems) භාවිතා කරන පරිගණක මත සිංහල යුනිකේත ක්‍රමය භාවිතයෙන් සිංහල බස පරිගණක භාවිතයට යොදා ගත හැක.

සිංහල යුනිකේත භාවිතය සඳහා අවශ්‍ය සියලු මෘදුකාංග හා උපදෙස් www.siyabas.lk හා www.locallanguages.lk වෙබ් අඩවිවලින් නොමිලයේ ලබා ගත හැක.

එසේම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට ලිපියක් එවීමෙන් ද මෙම මෘදුකාංග අඩංගු සංයුක්ත තැටියක් නොමිලයේ ලබාගත හැක.

2007-03-14 දින අංක SP/SB/01/07 දරණ චක්‍රලේඛය මගින් සියලු රාජ්‍ය ආයතන පරිගණක කටයුතු සඳහා සිංහල භාවිතා කිරීමේදී සිංහල යුනිකේත පමණක් භාවිතා කළ යුතු බැව් ජනාධිපති ලේකම්, ලලිත් වීරතුංග මහතා විසින් සියලු රාජ්‍ය ආයතන වෙත දන්වන ලදී. එම ලිපියේ පිටපතක් ඔබගේ දැන ගැනීමට මෙයට අමුණා ඇත.

e Sri Lanka
*smart people smart island*

160/24, කිරිමණ්ඩල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව 160/24, கிரிமண்டல மாவத்தை, கொழும்பு 5, இலங்கை 160/24, Kirimandala Mawatha, Colombo 05, Sri Lanka

දුරකතන : / தொலைபேசி: / Tele : +94-11-2369099
ෆැක්ස් : / தொலை நகல் : / Fax : +94-11-2369091
ඊ මේල්: / மின்னஞ்சல்: / E-mail: info@icta.lk
වෙබ් : / இணையம் : / Web : www.icta.lk

දැනටමත් රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ සිංහල යුනිකෝඩ් භාවිතය ප්‍රචලිත වෙමින් පවතින අතර සිංහල යුනිකෝඩ් මගින් සැකසුනු රාජ්‍ය හා පුද්ගලික වෙබ් අඩවි රාශියක් පවතී. එසේම බහුතරයක් වාණිජ පරිගණක මෘදුකාංග සමග සිංහල යුනිකෝඩ් ක්‍රමය මැනවින් ක්‍රියා කරයි.

එහෙයින් ඔබ ආයතනයේ පරිගණක සඳහා සිංහල යුනිකෝඩ් භාවිතා කිරීම මගින් සිංහල මෘදුකාංග මිළදී ගැනීමට වැයවන මුදල් ඉතිරි කර ගැනීමටත් රජයේ සියළුම ආයතනවලට ඔබගේ පරිගණක ලේඛණ කියවීමට හා භාවිතා කිරීමට හැකිවන තත්වයක් උදාකර ගැනීමටත් පියවර ගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

ස්තූතියි.

මීට විශ්වාසී,
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

වසන්ත දේශප්‍රිය
අධ්‍යක්ෂ, රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන